**දුරකථන**/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary: 2784812
කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, **Fax**: 2784846
ඊමේල්/ஈ–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
**Ministry of Education**

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர
கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No:

මගේ අංකය / எமது இல. / My No.: ඊඞ්/1/15/2/2/100

දිනය / திகதி / Date: 2008-11-17

චක්‍රලේඛ අංකය 2008/40

සියළුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළුම පළාත් භාර නි.අ.අ. (ශා.අ) වරුන්,
සියළුම කළාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළුම විදුහල්පතිවරුන්,
ජාතික ක්‍රීඩා සංගම් වල බලධාරීන්,
පාසල් ක්‍රීඩා සංගම් වල බලධාරීන්.

## දේශීය හා විදේශීය ක්‍රීඩා තරගාවලි හා තෝරා ගැනීමේ පරීක්ෂණ සඳහා පාසල් ළමුන් සහභාගී කරවීම

පාසල් ළමුන් උක්ත තරගාවලි වලට සහභාගී කරවීමේදී අදාළ පාසල් ක්‍රීඩා සංගම්, ජාතික ක්‍රීඩා සංගම් හා වෙනත් ආයතන වල බලධාරීන් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වලින්/ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අදාල පරිදි විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. පහත සඳහන් පරිදි මෙම අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ.

2.

| | තරගාවලියේ ස්වභාවය | අනුමැතිය ලබාගත යුතු ආයතනය |
|---|---|---|
| 1. | කළාප/ පළාත් මට්ටමේ තරගාවලි | අදාල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 2. | සමස්ත ලංකා මට්ටමේ තරගාවලි | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 3. | විදේශ ක්‍රීඩා තරගාවලි සදහා පළාත් මට්ටමේ කණ්ඩායම් සහභාගී කරවීම | අදාල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 4. | විදේශ තරගාවලි සදහා ශ්‍රී ලංකා පාසල් කණ්ඩායම් සහභාගී කරවීම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 5. | ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම් සදහා (පාසල් ළමුන් ඇතුලත් වන්නේ නම් පමණක්) | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 6. | ජාතික පාසල් ක්‍රීඩා කණ්ඩායම් විදේශ තරගාවලි වලට සහභාගී වීම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 7. | පළාත් පාසල් ක්‍රීඩා කණ්ඩායම් විදේශ තරගාවලි වලට සහභාගී වීම | අදාල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය |
| 8. | රජයේ අනුමත ආධාර ලබන හා රජයේ අනුමත ආධාර නොලබන පෞද්ගලික පාසල් ක්‍රීඩා කණ්ඩායම් විදේශගත වීම. | අධ්‍යාපන අමාත්‍යාංශය |

3. දේශිය හා විදේශිය තරගාවලි වලට විවිධ සංගම් ආයතන හා පුද්ගලයන් විසින් පාසල් ළමුන් අධ්‍යාපන අමාත්‍යාංශයේ / පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව සහභාගී කරවීම පසුගිය කාලයේදී බහුලව දක්නට ලැබුනි. මෙම තරගාවලි ඉතා අවිධිමත්ව සංවිධානය කරන බවත් පාසල් සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ නිසි අවධානය යොමු නොකරන බවත් එළිදරව් වී ඇත. එම නිසා පාසල් ක්‍රිඩක ක්‍රිඩිකාවන් විවිධ අපහසුතාවයන්ට හා රෝගාබාධ වලට ගොදුරු වී ඇති අතර ඇතැම් අවස්ථාවල මරණයට පවා පත් වී ඇත. මෙම තත්ත්වය වලක්වා ගැනීම සඳහා ඉහත උපදෙස් වලට අනුව ක්‍රියා කිරීමට අදාල බලධාරීන් වග බලා ගත යුතු බව අවධාරනය කරමි.

4. උක්ත අනුමැතිය ලබා ගැනීම සඳහා පහත සඳහන් විස්තර දැක්වෙන ලිපි ලේඛන අදාල අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කළ යුතුය.

1. තරගාවලිය පැවැත්වීමේ අරමුණ
2. තරග පැවැත්වෙන ස්ථානය හා දිනය
3. සහභාගී කරවන ළමුන් සංඛ්‍යාව හා වයස් සීමාව
4. තරග විනිශ්චය කරනු ලබන්නේ කවුරුන් විසින් ද යන්න හා ඔවුන්ගේ සුදුසුකම්
5. ළමුන්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග
6. මෙම තරගාවලි පැවැත්වීමේදී ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියාගේ හෝ නිලධාරීන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක

ඉහත 2.1 හා 2.2 තරගාවලි සඳහා අනුමැතිය ලබා ගැනීමට ඉහත 4.1 සිට 4.6 දක්වා ඇති ලියවිලි ඉදිරිපත් කල යුතුය. ඉහත 2.3 සිට 2.7 දක්වා ඇති කාර්යයන් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 2004/29 චක්‍රලේඛය, 2006/46 චක්‍රලේඛය හා මගේ සමාංක හා 2005.08.11 දින දරණ උපදෙස් ලිපි වලට අනුකූලව කටයුතු කර අනුමැතිය ලබා ගත යුතුය.

5. විදුහල්පතිවරුන් තම ක්‍රිඩක ක්‍රිඩිකාවන් තරග වලට සහභාගී කරවීමේදී එම තරගාවලි පැවැත්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගෙන තිබේද යන්න විමසා බලා සැහීමකට පත් විය යුතුය.

6. අත්‍යවශ්‍යම අවස්ථාවක හැර පාසල් පැවැත්වෙන දිනවල ක්‍රීඩා තරග නොපැවැත්විය යුතුය. තුන්වන පාසල් වාරයේදී පාසල් පවත්වන දිනවල ක්‍රීඩා තරග නොපැවැත්වීමට සියලුම ක්‍රීඩා සංගම් ප්‍රධානීන් හා විදුහල්පතිවරුන් වගබලා ගත යුතුය.

ඉහත නියෝග නොසලකා කටයුතු කරන පාසල් ප්‍රධානීන්ට හා ක්‍රිඩා සංගම් නිලධාරීන්ට විරුද්ධව විනයානුකූල කටයුතු කරන බවට අවධාරණය කරමි.

එම්.එම්.එන්.ඩී බණ්ඩාර
අධ්‍යාපන ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය